# මානව භාෂාවේ ස්වභාවය

ජයමල් ද සිල්වා

Language is the most important means of communication used among human beings. It is through language that human beings share their ideas, emotions, beliefs and feelings with each other. Though many other means of communication are used among humans, they are not as flexible, comprehensive, prefect or extensive as language. All human beings are blessed with language and it is considered the specific property of human beings. The uniqueness of human language is evident when it is compared with animal communication system which is not well developed and has extremely limited function. Nevertheless, defining 'human language' appears to be a tough task and a good definition is expected to cover three aspects of language, namely nature, structure and function. This paper is an illustration of the characteristics of human language with the intention of bringing into light what makes it unique, ubiquitous and irreplaceable.

---

© ජයමල් ද සිල්වා

සංස්. පී. ඒ. අමිල මදුසංක, ජයමල් ද සිල්වා, දිල්ෂාන් මනෝජ් රාජපක්ෂ, චන්දන රුවන් කුමාර, එච්. ඒ. ගිහාන් මධුසංඛ, නන්දුලා පෙරේරා
'ප්‍රභා' ශාස්ත්‍රීය සංග්‍රහය, සිවු වැනි කලාපය - 2014/2015
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

මානවයා අතින් නිමැවුණු අපූර්වතම වූ ද, අද්විතීය වූ ද මෙවලම භාෂාව යි. චින්තනය සඳහාත්, එහි දී තම සිතෙහි හට-ගන්නා සිතිවිලි සෙස්සන් සහ බෙදාහදා-ගැනීමටත්, අන්‍යෝන්‍ය ක්‍රියාකාරිතා පැවැත්වීමටත්, තම සංස්කෘතිය ප්‍රවාහණයටත් මානවයා භාවිත කරන මාධ්‍යය භාෂාව යි. මානවයා සෙසු සත්ත්වයන් අතරින් සුවිශේෂ වීමට බලපාන මූලික හේතුව වන්නේ ද මෙලෙස භාෂාව භාවිත කිරීමට ඔහු දක්වන සාමර්ථ්‍යය, එනම් ඔහු සතු භාෂා ශක්‍යතාව (language competence) යි. 'කතා කරන සත්ත්වයන්' (*homo loquens*) යනුවෙන් මානවයා හැඳින්වෙන්නේ ද ඔහු සතු භාෂා ශක්‍යතාව හේතුවෙනි.[1] නව දැනුම සෙවීමට, ගබඩා කර තැබීමට සහ අනාගත පරපුරට ලබා-දීමට මෙන් ම අතීතය, වර්තමානය හා අනාගතය යන කාල ත්‍රයය එකිනෙක යා කිරීමට මානවයා සමත් ව ඇත්තේ ද මේ අද්විතීය ශක්‍යතාව හේතුවෙනි. මානවයාට භාෂාව කොතරම් වැදගත් වූවක් දැ යි පැවැසුව හොත් භාෂාව නොමැති මානව සමාජයක් පිළිබඳ සිතීම පවා අශක්‍ය ය. විවිධ ශාරීරික ඉඟි, ලසු ලේඛනය, බ්‍රේල් හෝඩිය, මෝස් කේත ඈ සංඥා පද්ධති මෙන් ම රූප සටහන්, සිතියම්, විවිධ ශබ්ද ආදිය භාවිතයෙන් ද මානව සන්නිවේදනය සිදු වන බව සත්‍යයකි. එනමුදු යම් ආකාරයකින් භාෂාව ම පදනම් කර-ගත් එකී ක්‍රම භාවිතයෙන් ප්‍රකාශ කළ හැකි අදහස් අතිශය සසීම වේ.

සංස්කෘතයෙහි 'ව්‍යක්ත වචන' අර්ථයෙහි යෙදෙන √භාෂ්- ධාතුවෙන් නිපන් කරණ කාරක කෘදන්තයක් වන 'භාෂා' යන්නෙන් 'භාෂණයට හෙවත් කථා කිරීමට උපකරණ වන්නක්' යන අර්ථය ලැබේ.[2] මෙයට සමානාර්ථවත් ව ඉංගිරිසියෙහි යෙදෙන 'language' නැමැති යෙදුම ලතිනයෙහි 'ජිහ්වාව' (දිව) යන අර්ථය දෙන '*lingua*' යන්නෙන් තද්භව වූවකි. '*lingua*' යන්න ඉන්දු-යුරෝපීය මූල භාෂාවේ (Proto Indo-European) **dnghu-* යනුවෙන් යෙදෙන්නට ඇතැ යි සැලැකේ.[3]

√භාෂ්- ධාතුවෙන් නිරූපිත 'ව්‍යක්ත වචන' යන්නෙන් ගම්‍ය වන්නේ 'ස්වර - ව්‍යඤ්ජන වසයෙන් පැහැදිලි ශබ්ද සහිත වීම' යන්න යි. ඒ අනුව මානවයා අතර භාවිත වන සන්නිවේදන මාධ්‍යය 'භාෂාව' යනුවෙන් හැඳින්වෙන අතර ස්වර - ව්‍යඤ්ජන වසයෙන් පැහැදිලි නො වන, එනම් 'අව්‍යක්ත' ශබ්ද හැඳින්වීම සඳහා යෙදන්නේ

√නද්- ධාතුවෙන් නිපන් 'නාද' යන කෘදන්තය යි.[4] කාහල නාදය, ඝණ්ටා නාදය ඈ මෙයට නිදසුන් ය.

'මානව භාෂාව' නිර්වචනය කිරීමට බොහෝ වාග්විද්‍යාඥයන් ප්‍රයත්න දරා ඇති නමුදු ඒ සම්බන්ධ පරිපූර්ණ අර්ථ නිරූපණයක් ඉදිරි පත් කිරීම දුෂ්කර කර්තව්‍යයක් බව් පෙනෙන්නට තිබේ. පහත දැක්වෙන්නේ එවැනි නිර්වචන කිහිපයකි.

**"භාෂාව වනාහි නෛසර්ගික ව උත්පාදිත සංකේත පද්ධතියක් ඇසුරෙන් සංකල්ප, මනෝභාව හා අභිප්‍රාය සන්නිවේදනය කෙරෙන හුදු මානවීය වූ ද නිර්සහජාශයික වූ ද ක්‍රමෝපායකි."**[5]
- එඩ්වඩ් සැපියර් (1921)

**"භාෂාවක් නම් වාක්‍ය සමුදායයකි."**[6] - කුමාරතුංග මුනිදාස (1938)

**"භාෂාවක් යනු සසීම අවයව සමූහයකින් නිර්මිත වූත් දීර්ඝතාව අතින් සසීම වූත් (සසීම හෝ අසීම) වාක්‍ය සමූහයකි."**[7]
- නෝම් චොම්ස්කි (1957)

**"භාෂාව යනු පරිචිත වසයෙන් භාවිත වාච්‍ය-ශ්‍රව්‍ය වූත් අර්පිතාර්ථක වූත් සංකේත උපකාරයෙන් මානවයා එකිනෙකා සමඟ සන්නිවේදනය සහ අන්තර් ක්‍රියා පවත්නා-ගන්නා ව්‍යවහාරයකි."**[8]
- හෝල් (1969)

**"භාෂාව වූකලි මනුෂ්‍ය කණ්ඩායම් තමන් අයත් යම් සමාජයක (භාෂණ සමාජයක) භාවිත කරන මූලික සන්නිවේදන පද්ධති වේ."**[9]
- ජෝන් ලයන්ස් (1970)

**"භාෂාවක් යනු මානව සන්නිවේදනය සඳහා භාවිත වන අර්පිතාර්ථක වාක් සංකේත පද්ධතියකි."**[10] - රොනල්ඩ් වෝඩොෆ් (1972)

**"භාෂාව වනාහි හුදු හෝ අර්පිතාර්ථක සම්මුති පදනම් කර-ගත් සංකේත පද්ධතියකි. එය භාෂකයාගේ වෙනස් වන අවශ්‍යතා හා ස්වභාව අනුව වෙනස් කළ හැකි සේ ම අසීමාන්තික ව විස්තාරණය කළ හැකි ද වේ."**[11] - ආර්. එච්. රොබින්ස් (1985)

උක්ත නිර්වචනයන්ගෙන් කියැවෙන පරිදි මානව භාෂාවේ ලක්ෂණ මෙලෙස දැක්විය හැකි ය.

1. වාක් සංකේත පද්ධතියක් බව
2. වාක්‍ය සමුදායයක් බව
3. සන්නිවේදන උපක්‍රමයක් බව
4. අර්පිතාර්ථක බව
5. වෙනස් කළ හැකි බව
6. විස්තාරණය කළ හැකි බව
7. මානවයාට පමණක් සීමා වන බව
8. නිර්සහජාශයික බව
9. වාච්‍ය-ශ්‍රව්‍ය බව
10. පරිචිත වසයෙන් භාවිත වන්නක් බව

මෙකී ලක්ෂණ සියල්ල මානව භාෂාවේ ස්වභාවය (nature), සංස්ථිතිය (structure) සහ කෘත්‍යය (function) යනුවෙන් තෙ වැදැරුම් ව දැක්විය හැකි ය. කෙසේ වතුදු, විවිධ වාග්විද්‍යාඥයන් විසින් ඉදිරි පත් කරන ලද උක්ක නිර්වචන විමසා බැලීමේ දී ගම්‍ය වන්නේ භාෂා නිර්වචනය සම්බන්ධයෙන් පොදු එකඟතාවක් නො පැවැති බවත් යට කී තෙ වැදැරුම් ලක්ෂණ ආවරණය වන පරිදි මානව භාෂාව නිර්වචනය කිරීම දුෂ්කර කටයුත්තක් බවත් ය. මානව භාෂාව පිළිබඳ වැදැගත් නිරීක්ෂණ ගණනාවක් ඉදිරි පත් කරන නමුදු මානව භාෂාවේ එකී තෙ වැදැරුම් ලක්ෂණ ආවරණය කිරීමට මේ නිර්වචන අපොහොසත් ව තිබේ. මෙකී දුබලතා මඟ හැරැවුණු, එනම් මානව භාෂාවේ ස්වභාවය, සංස්ථිතිය සහ කෘත්‍යය යන ලක්ෂණ ත්‍රයය ම ආවරණය කෙරෙන නිර්වචනයක් ලෙස බ්‍රිටැනිකා විශ්වකෝශයට 'Language' නැමැති නිබන්ධයෙහි ලා 1962 වසරේ දී ජෝර්ජ් එල්. ට්‍රේගර් ඉදිරි පත් කළ නිර්වචනය සැලැකේ.[12] එහි දී භාෂාව විග්‍රහ වී ඇත්තේ මතු දැක්වෙන පරිදි ය.

**"භාෂාව වනාහි සමාජ කණ්ඩායමක කොටස්කරුවන් ද, සංස්කෘතියක සහභාගිකයන් ද වන මානවයා අන්‍යෝන්‍ය ක්‍රියා සහ සන්නිවේදනය සඳහා යොදා-ගන්නා අර්පිතාර්ථක වාක් සංකේත පද්ධතියකි."**[13]

මානව භාෂාවේ ස්වභාවය වසයෙන් අර්පිතාර්ථක බව ද, සංස්ථිතිය වසයෙන් වාක් සංකේත පද්ධතියක් වීම ද මෙහි දැක්වෙන අතර කෘත්‍යය වසයෙන් දැක්වෙන්නේ අන්‍යෝන්‍ය ක්‍රියා සහ සන්නිවේදනය සඳහා භාවිත වීම යි.

**"භාෂාව නිසැක වසයෙන් ම මානවයා අතර භාවිත වන සන්නිවේදන උපක්‍රම විශේෂයකි. මූලික වසයෙන් වාචික ශබ්දයන් ගෙන් සමන්විත එය උච්චාරණමය, ක්‍රමානුකූල, සංකේතාත්මක හා අර්පිතාර්ථක පද්ධතියකි."**[14] යනුවෙන් ඒ. ඊ. ඩර්බිශයර් විසින් 1967 වසරේ දී ඉදිරි පත් කරන ලද නිර්වචනය ද භාෂාවේ උක්ත තෙ වැදෑරුම් ලක්ෂණ ආවරණය කරයි. කෙසේ නමුදු මානව භාෂාව පිළිබඳ කරන ලද අංග සම්පූර්ණ නිර්වචනය වසයෙන් බොහෝ වාග්විද්‍යාඥයන්ගේ පිළිගැනීමට ලක් ව ඇත්තේ එයට වසර පහකට පෙර ට්‍රේගර් ඉදිරි පත් කළ නිර්වචනය හෙයින් මේ විග්‍රහය සඳහා ද එය පාදක කර-ගැනේ.

ස්වභාවය අනුව ගත් කල මානව භාෂාව ම 'අර්පිතාර්ථක' (arbitrary) හෙවත් 'සම්මුතික' (conventional) වූවක් ලෙස සැලැකේ. සංකේත සංකලනයෙන් ගොඩනැගුණු සංස්ථානය (construction), එනම් වචනය සහ ඉන් නිරූපිත වස්තුව අතර අනුරූපතාවක්, නැත හොත් නෛසර්ගික සබඳතාවක් නො පැවැතීම ද, එකී සබඳතාව හුදු සමාජ සම්මුතිය අනුව ගොඩනැඟී තිබීම ද මෙසේ සැලැකීමට හේතු වේ. 'ගස' යන සිංහල වචනය සහ ඉන් නිරූපිත වස්තුව අතර මේ යැ යි නිශ්චිත ව පෙන්වා-දිය හැකි සබඳතාවක් නො පවතී. එනමුදු එකී සංකේතනිය නිරූපණය කිරීම සඳහා 'ගස' යන වාක් සංකේතය භාවිත වන්නේ සිංහල භාෂාවේ යම් අවස්ථාවක අහඹු ලෙස එලෙස භාවිත වී පසු ව සම්මතයක් බවට පත් වූ බැවිනි. වාක් සංකේතය සහ සංකේතනිය අතර එලෙස නෛසර්ගික සබඳතාවක් නො පැවැතීම 'අර්පිතාර්ථක බව' හෙවත් 'රූඪීකෘත බව' ලෙස ද සංකේතය සහ සංකේතනිය අතර ගොඩනැඟී ඇති සබඳතාව භාෂකයන් විසින් ආරෝපණය කරන ලද හුදු සම්මුතියක් පමණක් වීම 'සම්මුතික බව' ලෙස ද හැඳින්වේ. සිංහලයෙහි 'ගස' නැමැති වාක් සංකේතයෙන් නිරූපිත සංකේතනිය නිරූපණයට සංස්කෘතයෙන් 'වෘක්ෂ', පාළියෙන් 'වෘක්ඛ', ඉංගිරිසියෙන් 'tree',

ජර්මන භාෂාවෙන් 'Baum', දෙමළයෙන් 'மரம்' ඈ ලෙසින් විවිධ වාක් සංකේත භාවිත වීමට බලපා ඇති තර්කානුකූල හේතුවක් නොමැත. මානව භාෂාව අර්පිතාර්ථක හා සම්මුතික නො වී වාක් සංකේතය සහ සංකේතනිය අතර නෛසර්ගික සබඳතාවක් තිබිණි නම් ලොව පවතිනු ඇත්තේ එක් භාෂාවක් පමණි.

භාෂා අතර පවතින ඥාති සබඳතා හේතුවෙන් යම් සංකේතනි නිරූපණයට බොහෝ සෙයින් සමාන වාක් සංකේත භාවිත වන අවස්ථා ද දක්නට ලැබේ. සිංහලයෙහි 'අට' නැමැති වාක් සංකේතයෙන් නිරූපිත සංඛ්‍යාව දැක්වීමට සංස්කෘතයෙන් 'අෂ්ට', පාළියෙන් 'අට්ඨ', ලතිනයෙන් 'ඔක්ටෝ', ඉංගිරිසියෙන් 'එයිට්', හින්දියෙන් 'ආට්', ජර්මන භාෂාවෙන් 'අක්ට්' යන වාක් සංකේත භාවිත වීම මෙයට නිදසුනක් සේ දැක්විය හැකි ය.[15] පළමු වැනි නිදසුනෙහි 'වෘක්ෂ' යන සංස්කෘත යෙදුම 'වෘක්ඛ' යනුවෙන් පාළියට බිඳීමත්, 'රුක' යනුවෙන් සිංහලයට බිඳීමත් එවැනි සංසිද්ධියක ප්‍රතිඵලයකි. එක ම මූලයකින්, එනම් මූල ඉන්දු-යුරෝපීය නමින් හැඳින්වෙන උපකල්පිත භාෂාවෙන් ප්‍රභින්න වූ උක්ත භාෂා අතර පවතින එබඳු රූපීය සාම්‍යතා වූකලි ඓතිහාසික සංසිද්ධියක, වෙනත් අයුරකින් පැවැසුව හොත් එක ම මූලයකින් ප්‍රභවය ලැබීමේ ප්‍රතිඵලයකි. ඉන්දු-යුරෝපීය භාෂා පවුලට ඥාති සබඳතාවක් නො දක්වන ද්‍රාවිඩ භාෂා පවුලට අයත් දෙමළ භාෂාවෙන් 'අට' නැමැති සංකේතනිය නිරූපණයට භාවිත වන 'எட்டு' (එට්ටු) නැමැති වාක් සංකේතය ද ඉන්දු-යුරෝපීය භාෂාවන්හි යෙදෙන වාක් සංකේත හා යම් සම්‍යයක් දක්වන නමුදු එය හුදු භාෂා සංස්පර්ශයේ (language contact) ප්‍රතිඵලයක් සේ සැලැකිය හැකි ය. ඓතිහාසික සංසිද්ධි පදනම් ව විවිධ භාෂා අතර එක ම අර්ථය සඳහා බොහෝ සෙයින් සමාන වාක් සංකේත භාවිත වුව ද අර්පිතාර්ථක බව සහ සම්මුතික බව ඉක්මවන ලක්ෂණ එහි ද විද්‍යමාන නො වේ.

සංකේතනිය සමඟ පැහැදිලි අනුරූපතාවක් පවතින වාක් සංකේත යම් තරමකට දක්නා ලැබෙන නමුත් භාෂාවේ අර්පිතාර්ථක බව බිඳ හෙළීමට තරම් එය ප්‍රමාණවත් නො වේ. මෙය දෘශ්‍ය අනුරූපතාව (visual iconicity) සහ ශ්‍රව්‍ය අනුරූපතාව (auditory iconicity) යනුවෙන් දෙ වැදෑරුම් වේ. පුරාණ මිසර ලේඛනයන්හි දැක්වෙන

රූපාක්ෂර (hieroglyphs) සහ චීන, ජපන් ඈ භාෂාවන්හි භාවිත වන රූපාක්ෂර (characters) සංකේතනිය සමඟ දෘශ්‍ය අනුරූපතාව දක්වන වාක් සංකේත වේ. ශබ්දානුකරණ පද (onamatopeia), එනම් ශබ්දය ආශ්‍රයෙන් අර්ථය ගම්‍යමාන වන වචන හෝ පද සංයෝග[16] සංකේතනිය සමඟ ශ්‍රව්‍ය අනුරූපතාව දක්වන වාක් සංකේත වේ. සිංහලයේ එන ඩෝං, ජබොස්, ගුම්ගුම්, චටපටස්, චිරිචිරි ආදියත්, ඉංගිරිසියේ එන thud, bang, splash, buzz, cuckoo ආදියත් මෙයට නිදසුන් වේ. දෘශ්‍ය අනුරූපතාව භාෂා කිහිපයකට පමණක් සීමා වන අතර ශ්‍රව්‍ය අනුරූපතාව දක්වන වාක් සංකේත භාෂාවක දක්නට ලැබෙන්නේ සසීම ප්‍රමාණයකි. එක් එක් භාෂාවන්හි භාවිත වන එවැනි යෙදුම් අතර සමරූපතාවක් හැම විට ම හඳුනා-ගත හැකි ද නො වේ.

සංස්ථිතිය වසයෙන් ගත් කල මානව භාෂාව වාක් සංකේත පද්ධතියකි. ට්රේගර්ගේ නිර්වචනයෙන් පළමු ව කියැවෙන්නේ භාෂාව 'සංකේත පද්ධතියක්' (symbol system) බව යි. ලේඛන ස්වරූපයක් ඇති හැම භාෂාවක ම ඒවායේ භාෂණයේ පවත්නා ශබ්ද ලියා දැක්වීම සඳහා සම්මුතික සංකේත පවතී. /s/ ශබ්දය දැක්වීම සඳහා ඉංගිරිසියෙන් 'S' සංකේතය ද සිංහලයෙන් 'ස්' සංකේතය ද භාවිත වීම නිදසුනක් වසයෙන් දැක්විය හැකි ය. භාෂාවක භාවිත වන ශබ්ද අතුරින් අර්ථ භේද කාරක ශබ්දිම (phonemes) නිරූපණය කරන මෙවැනි සංකේත එක් කර 'වර්ණ මාලාවක්' (alphabet) තැනෙන අතර අවශ්‍යතාව හා පිළිගත් රීති සමුදායයක් අනුව සංකේත සංකලනයෙන් අර්ථාන්විත වදන් ගොඩනැංවේ.

උදාහරණයක් වසයෙන් ඉංගිරිසියේ 'train' යන සංස්ථිතිය සලකා බලමු. එයින් නිරූපණය වන්නේ ගමනාගමනය සඳහා භාවිත වන මාධ්‍යයකි. ඒ වදන තැනී ඇත්තේ t, r, a, i, සහ n යන සංකේත එක් වීමෙනි. එසේ නම් ඒ සංකේත ම එක් වීමෙන් තැනෙන 'aintr' හෝ 'tinra' වැනි සංස්ථිතියකින් එකී වස්තුව නිරූපණය කළ නො හැකි ද? 'train' යන සංස්ථිතියේ අවයව සියල්ල ඇතුළත් වුව ද ගමනාගමනය සඳහා භාවිත වන එකී මාධ්‍යය 'aintr' හෝ 'tinra' ඈ සංස්ථිතියකින් නිරූපණය නො කෙරෙන අතර ඒ සඳහා භාවිත කළ හැක්කේ 'train' යන සංස්ථිතිය ම පමණි. එකී සංස්ථිතිය හා ඉන් නිරූපිත වස්තුව අතර අනුරූප සම්බන්ධයක් (iconic relation) නො

පවතින නමුදු ඒ සංස්ථිතියෙන් ඒ වස්තුව නිරූපණය වෙතැ යි සම්මතයක් ගොඩනැඟී තිබීම මෙයට හේතුව යි. මෙවැනි සම්මත පහසුවෙන් වෙනස් කළ හැක්කේ නො වේ.

මානව භාෂාව මූලික වසයෙන් ම වාචික ශබ්ද (vocal sounds) පදනම් කර-ගත්තකි. මනුෂ්‍ය ශරීරයේ ඇති උච්චාරණ යාන්ත්‍රණය හරහා මේ වාචික ශබ්ද නිපැදැවේ. මානව භාෂාව ප්‍රභවය වූයේ වාචික ශබ්ද සන්තතියක් ලෙසිනි. මේ වාචික ශබ්ද නිරූපණය කිරීමේ ක්‍රමවේදයක් වසයෙන් බොහෝ කලකට පසු ලේඛනය නිර්මාණය විය. ඒ අනුව ගත් කල ලේඛනය භාෂණයට පසු ව ප්‍රභවය වූවකි. භාෂාවේ මූලික වන්නේ භාෂණය වන අතර ලේඛනය දෙ වැනි තැන ලා සැලැකේ. කුඩා දරුවකු පළමු ව අදහස් පළ කරන්නේ භාෂණයෙනි. ලේඛනය උගන්නේ පසු ව ය. මිනිසකු ජීවිත කාලය පුරා ලේඛනයෙන් ඉදිරි පත් කරන අදහස් ප්‍රමාණයට කිහිප ගුණයකින් වැඩි ප්‍රමාණයක අදහස් භාෂණයෙන් ඉදිරි පත් කෙරේ. භාෂණය ඉක්මවා ලේඛනය සතු වූ එක ම විශේෂත්වය වූයේ පැවැත්ම යි. යමක් ගබඩා කර තබා-ගත හැකි වූයේ එය ලේඛනගත වූයේ නම් පමණි. තාක්ෂණයේ දියුණුවත් සමඟ පසු කාලීන ව මේ හැකියාව භාෂණයටත් හිමි විය. හැම අතින් ම ගත් කල පෙනී යන්නේ මානව භාෂාවේ මූලික වන්නේ භාෂණය බව යි. ලේඛන ස්වරූපයක් නොමැති නමුදු භාෂණ ස්වරූපයක් පමණක් පවතින භාෂා වර්තමාන ලෝකයේ පවා භාවිතයේ පවතී. ලේඛනයේ භාවිත වුව ද භාෂණයේ භාවිත නො වන භාෂා 'මෘත භාෂා' (dead languages) බවට පත් ව ඇත.

මානව භාෂාවේ කෘත්‍යය වසයෙන් ට්රේගර් පෙන්වා-දෙන අන්‍යෝන්‍ය ක්‍රියා පැවැත්වීම සහ සන්නිවේදනය මානව භාෂාවේ 'සමාජීය කාර්ය' නැත හොත් 'නිර්වචනාන්තර්ගත කාර්ය' වසයෙන් සැලැකෙන අතර 'ආත්මීය කාර්ය', නැත හොත් 'ව්‍යාප්තීකෘත කාර්ය' යනුවෙන් තවත් කාර්ය ප්‍රභේදයක් ද භාෂාවට අයත් වේ. සන්නිවේදනය සහ අන්‍යෝන්‍ය ක්‍රියාකාරිතා පැවැත්වීම යනුවෙන් සමාජීය කාර්ය දෙ වැදැරුම් වන අතර සාමාන්‍ය සන්නිවේදනය, ජන සන්නිවේදනය, අධ්‍යාපනය සහ භාව ප්‍රකාශනය 'සන්නිවේදනය' යන්නටත්, අන්‍යයන් මෙහෙයවීම, එක් ව ක්‍රියා කිරීම, හොඳ හිත පැවැත්වීම, විනෝදය, ආගමික කාර්ය, අනුෂ්ඨානීය කාර්ය සහ මානව

සංස්කෘති ප්‍රවාහණය 'අන්‍යෝන්‍ය ක්‍රියාකාරිතා පැවැත්වීම' යන්නටත් ගැනේ. චින්තනය/අන්තර්භාෂණය, ස්වයං භාෂණය සහ පාලුව මැකීම යන කාර්ය මානව භාෂාවේ ආත්මීය කාර්ය වේ.[17]

'සං - නි' උපසර්ග ද්වයය පූර්ව √විද්- ධාතුවෙන් පර ව 'අන' ප්‍රත්‍යය යෙදීමෙන් නිපන් කෘදන්ත නාමයක් වන 'සන්නිවේදනය' යන්නෙහි අර්ථය 'මනා ලෙස දැනුම්-දීම' යන්න යි.[18] තමන් වෙත පහළ වූ හැඟීමක්, අභිලාෂයක්, අදහසක්, අද්දැකීමක් වැනි යමක් සෙස්සනට මනා ලෙස දැනුම්-දීම සඳහා මානවයා භාෂාව භාවිත කරයි. භාෂාව මානවයාට පමණක් සීමා වූවකි. සන්නිවේදනය සඳහා භාෂාව යොදා-ගන්නේ මානවයා පමණි. මානව භාෂාව 'විශේෂ - විශේෂීය' (species - specific) වූවක් යැ යි සැලැකෙන්නේ එය එක් ජීවී විශේෂයකට, එනම් මානවයාට පමණක් සීමා වූවක් බැවිනි.[19] භාෂා ශක්‍යතාව වූකලි සමස්ත මානව වර්ගයා සතු ව ම පවතින ලක්ෂණයකි. යම් ආබාධ හේතුවෙන් භාෂා ශක්‍යතාව අහිමි වූවන් හැර සියලු මානවයෝ භාෂාවට හිමිකම් කියති. එබැවින් මානව භාෂාව 'විශේෂ - ඒකරූපී' (species - uniform) ද වේ.[20]

සතුන් අතර ද යම් ආකාරයක සන්නිවේදනයක් සිදු වන නමුදු මානව භාෂාව තරම් පුළුල් ව අදහස් ප්‍රකාශනය සඳහා එය භාවිත කළ නො හැකි බව A Course in Modern Linguistics (1958) නැමැති කෘතියෙහි ලා සී. එෆ්. හොකට් නිදසුන් සහිත ව පෙන්වා-දෙයි. මානව සන්නිවේදනය හා සත්ත්ව සන්නිවේදනය එකිනෙක සසඳා බැලීමෙන් මානව භාෂාව කොතරම් දියුණු, එමෙන් ම සංකීර්ණ පද්ධතියක් දැ යි අවබෝධ කර-ගත හැකි ය. අසීම අදහස් සංඛ්‍යාවක් ප්‍රකාශ කළ හැකි බව, විලක්ෂණීය (distinguishable) වූත් විභින්න (discrete) වූත් සංකේතයන්ගෙන් නිර්මාණය වී තිබීම, විවෘතාන්ත (open-ended) පද්ධතියක් වීම, සංස්ථිතික සංකීර්ණත්වය, නිර්සහජාශයික (non-instinctive) වීම, විස්තාපිත බව (displacement) ආදිය මානව භාෂාවට පමණක් ආවේණික ලක්ෂණ කිහිපයකි.

පැණි සොයා-ගත හැකි ස්ථානය කොහි දැ යි නර්තනයෙන් සෙසු මී මැස්සනට දැන්වීමට මී මැස්සෝ සමත් වෙති. එනමුදු පැණිවල තත්ත්වය කෙබඳු දැ යි දැන්වීම ඔවුනට කළ නො හැකි ය.

සසීම ශබ්ද සංඛ්‍යාවක් භාවිතයෙන් කෝපය, ආදරය, බිය ඈ හැඟීම් කිහිපයක් පළ කිරීමට සමහර වානර විශේෂ සමත් බව පර්යේෂණයන් ගෙන් තහවුරු වී තිබේ. එනමුදු ඉන් ඔබ්බට ගිය අදහස් ප්‍රකාශනයක් ඒ ඔස්සේ සිදු කිරීමට ඔවුනට හැකියාවක් නොමැත. තම භාෂාව භාවිතයෙන් අසීම අදහස් ප්‍රමාණයක් පළ කිරීමට මානවයා සමත් ය. තමන් භාවිත කරන භාෂාවට අයත් සසීම ශබ්ද සහ එකී ශබ්ද නිරූපණය කෙරෙන සසීම සංකේත සසීම රීති සමුදායයක් අනුව විවිධ ලෙස සංයෝග කරමින් අසීම අදහස් ප්‍රමාණයක් පළ කිරීමට හැකි වීම මෙහි පවත්නා අපූර්වත්වය යි.

මානව භාෂාවේ උපයුක්ත සංකේත විලක්ෂණීය මෙන් ම විභින්න ද වේ. ඒ අනුව යම් ශබ්ද තන්තුවක ඇතුළත් එක් එක් ශබ්ද සහ ඒ ශබ්ද නිරූපිත සංකේත පැහැදිලි ව හඳුනා-ගැනීමට හැකි ය. මානව භාෂාව ස්වර - ව්‍යඤ්ජන වසයෙන් පැහැදිලි ශබ්ද සහිත වූවකි. සිංහලයෙහි යෙදෙන 'වතුර' යන වචනයෙහි ව + තු + ර යන අක්ෂර සංයෝගය නිර්මාණයට දායක වූ 'ව්+අ', 'ත්+උ' සහ 'ර්+අ' යන ශබ්ද විභින්න ව දැක්විය හැකි ය. ස්වර ව්‍යඤ්ජන වසයෙන් පැහැදිලි නො වන ශබ්දයන්ගෙන් නිර්මාණය වූ සත්ත්ව සන්නිවේදනයෙහි මේ ලක්ෂණය දැකිය හැකි නො වේ. බල්ලකුගේ 'බව් - වව්' නාදයෙහි ඇතුළත් ශබ්ද ඉහත දැක්වූ ලෙසින් විභින්න ව දැක්විය හැකි නො වේ.

ජීවියකු මෙන් නිරන්තරයෙන් වැඩෙන මානව භාෂාව වූකලි විවෘතාන්ත පද්ධතියක් - කාලීන වෙනස්කම්වලට ලක් වන්නක් - වේ. භාෂාවක පවත්නා සම්මත වෙනස් කිරීම පහසු කරුණක් නො වුව ද ඒ සම්මත වෙනස් කළ නො හැක්කේ ද නො වේ. ආර්. එච්. රොබින්ස් පෙන්වා-දුන් පරිදි භාෂාවක් වෙනස් කළ හැකි ය. අසීම ව විස්තාරණය කළ හැකි ය. භාෂකයාගේ අවශ්‍යතා හා වෙනත් සමාජීය සාධක හේතුවෙන් භාෂාවක ලක්ෂණ වෙනස් විය හැකි ය. භාෂාව ඉබේ වෙනස් වීම 'භාෂා පරිණාමය' (language change) නම් වන අතර භාෂකයන්ගේ අවශ්‍යතාව පරිදි භාෂාව වෙනස් කිරීම 'භාෂා ක්‍රමසම්පාදනය' (language planning) නම් වේ. වචන සඳහා යෙදෙන අරුත් ඈ මෙලෙස විවිධ වෙනස්කම්වලට බඳුන් වේ. මෙවැනි වෙනස්කම් ඕනෑ ම භාෂාවක දැකිය හැකි වේ.

ප්‍රථම පුරුෂ - පුරුෂ ලිංග - සර්ව නාමයෙහි උක්ත විභක්ති ඒක වචනය ලෙසින් සම්භාව්‍ය සිංහලයෙහි 'හේ' යන්න භාවිත වූ අතර බහු වචන රූපය මෙන් ම අනුක්ත විභක්ති ඒක වචනය ලෙසින් ද භාවිත වූයේ 'ඔහු' යන්න යි. එනමුදු වර්තමාන සිංහලයෙහි 'ඔහු' යන්න උක්ත විභක්ති මෙන් ම අනුක්ත විභක්ති ඒක වචනය ලෙසින් ද යෙදෙන අතර 'හේ' යන්න භාවිතයෙන් බොහෝ දුරට ඉවත් ගොස් ව ඇත. වර්තමාන ඉංගිරිසියේ බහුල ව භාවිත වන google, like, inbox, bluetooth, unfriend ඈ ක්‍රියා පද නිර්මාණය වූයේ භාෂකයන්ගේ මෑත කාලීන අවශ්‍යතා අනුව ය. මේ ලක්ෂණය සත්ත්ව සන්නිවේදනය පද්ධතිය සඳහා අදාළ නො වේ. මී මැසි නර්තනය හෝ කපුටු කරච්ච ශත වර්ෂ ගණනකට පෙර පවතින්නට ඇත්තේ ද අද පවතින ස්වරූපයෙන් බව නිසැක ය.

මානව භාෂාව නිර්සහජාශයික වේ. 'විශේෂ - ඒකරූපී' වසයෙන් සියලු මානවයනට භාෂා ශක්‍යතාව හිමි වන නමුදු එය ඔහුට පූර්ණ වසයෙන් සහජාශයික ව උරුම වන්නක් නො වේ. මනුෂ්‍ය දරුවකු මෙලොව එළිය දකින්නේ කිසි යම් භාෂා ශක්‍යතාවකට උරුමකම් කියමිනි. තමා නිරාවරණය වන පරිසරයෙහි පවතින භාෂාව උපාර්ජනය කිරීමට ඔහුට එකී ශක්‍යතාව උපකාරවත් වන අතර එලෙස භාෂාව ඉගැනීම යම් නිශ්චිත කාල සීමාවක දී සිදු විය යුතු ය. භාෂා උපාර්ජනයෙහි ශීඝ්‍ර වර්ධනාත්මක අවධිය (critical period of language acquisition) නමින් හැඳින්වෙන මේ කාල සිමාවේ දී භාෂාවක් උපාර්ජනය කළ නො හැකි වුව හොත් පසු ව භාෂා ශක්‍යතාව ලබා-ගත හැකි නො වේ. නිර්සහජාශයික බව සත්ත්ව සන්නිවේදනයෙහි දක්නට නො ලැබෙන අතර අදහස් ප්‍රකාශනයෙහි ලා ඔවුන් සතු සසීම ශක්‍යතාව ප්‍රවේණිගත වූවකි.

මානව භාෂාවෙහි පවතින තවත් සුවිශේෂ ලක්ෂණයක් ලෙස විස්තාපිත බව හඳුනා-ගැනේ. භාෂාව භාවිතයෙන්, තමා සිටින ස්ථානය හා කාලය යන සාධක ඉක්මවා යෑමට - අතීතය හා අනාගතය පිළිබඳ මෙන් ම දූරස්ථ ස්ථානයක් පිළිබඳ අදහස් පළ කිරීමට ද මානවයාට හැකි ය. පැණි සොයා-ගත හැකි ස්ථානය කොහි ඇත් දැ යි නර්තනයෙන් සෙස්සනට ඇඟැවීම ඈ ලෙසින් ඉතා සසීම පරාසයක් ඇතුළත විස්තාපිත ව අදහස් පළ කිරීමට මී මැස්සන් සමත් වුව ද

කාලය පිළිබඳ අදහස් දැක්වීමට ඔවුනට නො හැකි ය. මානව භාෂාවෙහි මෙන් විස්තාපිත බවක් සත්ත්ව සන්නිවේදන උපක්‍රමයන්හි නො පවතී.

ශිෂ්ටාචාරගත වීමට පෙර යුගයේ මානවයා ස්වකීය අදහස් පළ කිරීමට විවිධ ප්‍රාථමික උපක්‍රම යොදා-ගන්නට ඇත. සසීම අදහස් ප්‍රමාණයක් පමණක් පළ කළ හැකි වූ එකී උපක්‍රමවලට සාපේක්ෂ ව මානව භාෂාව පවතින්නේ ඉතා දියුණු තත්ත්වයක ය.

## ආන්තික සටහන්

1. Pushpinder Syal and D. V. Jindal, **An Introduction to Linguistics** (Delhi: PHI Learning Private Limited, 2014), 06.
2. විමල් ජී. බලගල්ලේ, **භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය** (කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2012), 02.
3. “Language.” **Online Etymology Dictionary**.
http://www.etymonline.com/index.php?allowed_in_frame=0&search=language
4. විමල් ජී. බලගල්ලේ, **භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය** (කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2012), 01.
5. "Language is a purely human and non-instinctive method of communicating ideas, emotions and desires by means of a system of voluntarily produced symbols."
6. කුමාරතුංග මුනිදාස, **ව්‍යාකරණ විවරණය** (කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1968), 02.
7. "A language is a set (finite or infinite) of sentences, each finite in length and constructed out of a finite set of elements."
8. "Language is the institution whereby humans communicate and interact with each other by means of habitually used oral - auditory arbitrary symbols."
9. "Languages are the principle systems of communication used by particular group of human beings within the particular society (linguistic community) of which they are members."
10. "A language is a system of arbitrary vocal symbols used for human communication."
11. "Language is a symbol system based on pure or arbitrary conventions… infinitely extendable and modifiable according to the changing needs and conditions of the speakers."
12. විමල් ජී. බලගල්ලේ, **භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය** (කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2012), 11.

13. "Language is a system of arbitrary vocal symbols, by means of which human beings as members of a social group and participants in a culture, interact and communicate."
14. "Language is undoubtedly a kind of means of communication among human beings. It consists primarily of vocal sounds. It is articulatory, systematic and arbitrary."
15. මාතලේ සාසනතිලක ස්ථවිර, **වාග්විද්‍යාව** (කොළඹ: සීමා සහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1960), 213.
16. ඒ. වී. සුරවීර, **සාහිත්‍ය විචාර ප්‍රදීපිකා** (කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2005), 202.
17. විමල් ජී. බලගල්ලේ, **භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය** (කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2012), 21-22.
18. එම, 22.
19. Pushpinder Syal and D. V. Jindal, **An Introduction to Linguistics** (Delhi: PHI Learning Private Limited, 2014), 07.
20. ibid, 08.

## මූලාශ්‍රය නාමාවලිය

බලගල්ලේ, විමල් ජී. **භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2012.

මුනිදාස, කුමාරතුංග. **ව්‍යාකරණ විවරණය.** කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1968.

සාසනතිලක ස්ථවිර, මාතලේ. **වාග්විද්‍යාව.** කොළඹ: සීමා සහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1960.

සුරවීර, ඒ. වී. **සාහිත්‍ය විචාර ප්‍රදීපිකා.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2005.

Syal, Pushpinder and D.V. Jindal. **An Introduction to Linguistics**. Delhi: PHI Learning Private Limited, 2014.